# සිංහල වේලාව



**මෙ**ම මාතෘකාව යටතේ යමක් ලියන්නට මට සිතුණු වාර අනන්තය, අප්‍රමාණ ය. එහෙත් එය කල් දමන්නට ඇත්තේ ඉහත සඳහන් වේලාව එනතුරුය කියා මගේ යටි හිත කියයි.

සිංහලයා නැකතට, හරි වෙලාවට, විනාඩියටම තත්පරයටම වැඩ කරන්නට ම උපන් ජාතියකි. ඔර්ලෝසුව දිහා බලාගෙන ඉඳ ඒ නියම හෝරාවට තිතටම වැඩක් ඇරඹීම නැකතක් අනුගමනය කිරීමේ ස්වභාවයයි. අද ඊයේ නොව වසර දහස් ගණනක සිට සිංහලයා නැකත් අනුගමනය කරන්නේ ය. සරණ බන්ධනයේදී පෝරුවට නගින නැකතේ පටන් දරුවන් ලැබ ඔවුන්ට ඉඳුල් කටගෑම, අකුරු කියවීම, ඉස් කෝ ලෙට බාරදීම ආදී සියළු කටයුතු හරි විනාඩියට ම සිදු කරන සිංහලයා ඒ දරුවනුත් දීග දී, තම මුණුබුරු මිනිබිරියනුත් දැක, තමා වළට යනතුරු ජීවිතේ අනෙක් කිසිම කටයුත්තක් වේලාවට නොකරන්නේ මන්දැයි සිතාගත නොහැකි ය.

නැකතට නොකළහොත් අසුබ පල ඇතිවිය හැකියයි විස්වාසයක් ඔහු තුළ ඇති නිසා බව සැක නැත. ඒ ඇර ඉන් එහාට සිදුවන වෙන ඕනෑම දෙයක් ඕනෑම වෙලාවක කළාට කමක් නැතැයි ද ඔහු සිතයි.

එංගලන්තයේදීත් ලංකාවේ විදියටම කටයුතු කරන්නට බොහෝ දෙනා පෙළඹී සිටිති. ග්‍රිනිච් වේලාව සමග සසඳා ජ්‍යොතිශ්‍ය ශාස්ත්‍රයට අනුව නැකැත් සාදවා ගන්නා සිංහළ අය මෙහි සිටිති. දරුවන්ගේ කේන්ද්‍රය බලවා, ඒ අනුව ගණ හා සුබ අකුරු අනුව ළමයින්ට නම් ද තබති. කඩයක්, සාප්පුවක්, වෙළඳ ව්‍යාපාරයක් අරින විට නැතට අනුව හරි වෙලාවටම කිරි උතුරවති. පිරිත් කියවති. ඒ විදියට නියම වෙලාවට සියල්ල සිදුවෙනවා නම් අනේ කොපමණ හොඳද?

එහෙත් මෙය අවධාරණයෙන් කිව යුතු ය. මම එංගලන්තයේ වසර තිස්පහකට ආසන්න කාලයක් ජීවත්වෙමි. මේ කාල සීමාව තුළ ලාංකික උත්සව, සම්භාෂණ, නැටුම්, විවාහ මංගල්‍යයන්, උපන්දින සාද, ගෙටගෙවදීම්, සංගීත සංදර්ශන, ආධාර එකතුකිරීම්, රැස්වීම්, පෙළපාලි, ක්‍රීඩාතරඟ, බණ හා පිරිත් දේශන, අවමංගල්‍ය ආදී විවිධ කාරණා දහසකට ආසන්න ප්‍රමාණයකට මම සහභාගිවී ඇත්තෙමි. එහෙත් ඒ ඉහතකී කිසිම ලාංකික එකමුතුවක් කියපු වෙලාවට පටන්ගත්තේ නැතිබව සහතික වශයෙන් දනිමි.

ඔර්ලෝසු වර්ග බොහෝය. රවුම්, හතරැස්, තුන් හුලස්, අටපට්ටම්, බිත්ති ඔර්ලෝසු, ටයිම් පීස්, අතේ බඳින ඔය ආදී ඒ කුමන විදියේ ඔර්ලෝසුවක වුවද වෙලාව වෙනස් වෙතොත් විනාඩියක්, දෙකක් හෝ තුනක් පමණි. එහෙත් සිංහල වෙලාව වෙනස්වෙන්නේ පැය ගණනිනි. හතට පටන් ගන්නවා කිව්වොත් පටන්ගන්නේ අටට ය. නැත්නම් අටහමාරට ය. දවල් හෝ රෑ කෑමකට ආරාධනා කළහොත් සමහරු එන් නේ ආ අනෙක් අමුත්තන් කාබී ගෙවල්වලට යන්නට සූදානම් වන වෙලාවට ය. නිදහසට කියන්නට ඔවුන් ළඟ කාරණා රාශියක් ද ඇත.

ඈත අතීතයේ ඔර්ලෝසු නොතිබුණ යුගයේ ලංකාවේ සිංහලයින් වෙලාව බැළුවේ පැතැටියෙනි. නැත්නම් තමන්ගේ සෙවනැල්ල පියවරවල් වලින් මැනීමෙනි. රාත්‍රියේ නම් කෙහෙල් ගසක් කපා එහි ගොබය පීදෙන ප්‍රමාණය මැන බැලීමෙනි. එසේ කළේ වෙලාවක් අනුව වැඩ කටයුතු කළ ඉතා සුළු දෙනෙකු පමණි. රටේ ඉතිරි සියළු දෙන හැම දෙයක්ම කළේ තමන්ට හිතුණ හිතුණ වෙලාවටය. වැඩට ගියේ ඇහැ ඇරුණු වෙලාවක ය. උත්සවයකට ගියේ යායුතු වෙලා වට නොව තමන්ට හිතුණ වෙලාවට ය. සිංහලයින් තුළ ඇත්තේ තවම ඒ අතීත පුරුද්දය. උදාසීනකම නැත්නම් අමු කම්මැලිකමය. එය සිංහල සංස්කෘතිය බවට පත්ව ඇත. සිංහල උත්සවයක් නම් නියමිත වෙලාවට පටන් ගන්නේ නැති බවත්, පැයක් දෙකක් ප්‍රමාද වී ගියත් කමක් නැති බවත් බොහෝ දෙනාගේ අදහසයි.

දැනට සති දෙකකට ඉහතදී ලන්ඩනයේ පැවති විශේෂ උත්සව දෙකකට සහභාගිවීමේ භාග්‍යය අප කාටත් උදාවුණි. එකක් ලන්ඩනයේ පළවන ලංකාවිත්ති සිංහල පුවත්පතේ දසවෙනි සංවත්සරයයි. අනෙක ආනන්ද ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කළ ප්‍රවීන ගායන ශිල්පි වික්ටර් රත්නායකයන්ගේ ලන්ඩනයේ පැවති ස ප්‍රසංගයයි. මේ උත්සව දෙකම කලින් නියම කරගත් කණිසමට ආරම්භ නොවීම එහිවූ එකම අඩු පාඩුවයයි කිවහොත් බොහෝ දෙන එකඟවෙනවා ඇත. ආරම්භය ප්‍රමාද වනවිට අවසානය ඉක්මන්වීම වැළැක් විය නොහැකි ය.

කලින් වතාවක පණ්ඩිත් අමරදෙවයන්ගේ ලන්ඩන් ප්‍රසංගයකදී ඒ ශාලාව භාරව සිටි ආරක්ෂක නිලධාරීන් ප්‍රසංගය අවසන් වූ වහාම අමරදේව මහතා ඇතුළු ශ්‍රාවක සමූහයා පසුපස හඹායමින් සියළු දෙනාම ශාලාවෙන් පිටකළේ කිසිම ගරුසරුවක් ඇතිව නොවේ.

එහෙත් මේ කිසිවකින් සිංහලයෝ පාඩම් ඉගෙන නොගනිති. තමන්ගේ විදියට එංගලන්තයේ දේවල් කෙරෙන ආකාරය වෙනස් කරන්නට බැරිබව වටහා නොගනිති. මුන්ට තව පොඩ්ඩක් ඉන්න බැරි ඇයි කියමින් ඔවුන් කරන්නේ ශාලාවේ අයිතිකරුවන්ට හා සංවිධායකයින්ට බැන බැන ගෙදර යාම ය.

අප කවුරුත් පුරුදුව ඇත්තේ අපේ ප්‍රමාද දෝශයන් අනුන් පිට පැටවීමටය. අපි එයට හැබෑ දක්ෂයෝ වෙමු. උත්සව පටන්ගැන්මේ ප්‍රමාද ගැන සොයා බලන විට බොහෝ විට කියන්නේ පහන දල්වන්නට ප්‍රධාන අමුත්තා එනතුරු බලා සිටින බවයි. ප්‍රධාන අමුත්තා නැත්නම් කළ යුත්තේ ඉන්නා වෙන කෙනෙක් ලවා පාන පත්තු කරවා වෙලාවට වැඩ ඇරඹීම ය. එය මිදිකමක් නම් පහන නොදල්වාම කළුවරේ කටයුතු ඇර ඹීමය. ප්‍රමාද වී හෝ අමුත්තා ආවිට ශාලාව ඉබේම එළිය වැටෙනවා ඇත.

එංගලන්තයේ ඉංග්‍රීසි උත්සව හා සංදර්ශණ සියල්ල නියමිත වේලාවට පටන්ගෙන කියන වෙලාවට අවසන් වන බවත් මෙහි වෙසෙන අපි හොඳාකාරවම දනිමු. එවන් රටක ජීවත්වුනත් වෙලාවට වැඩකිරීමේ අවශ්‍යම ගුණාංගය ප්‍රගුණ කරන්නට අප කිසි විටක මහන්සි වී නැත. කෙනෙක් වෙලාවට යමක් කරනවා නම් අපම කියන්නේ ඔහු සුද්දා වගේ වැඩ කරනවා කියාය. සිංහළ වැඩක් නම් එය කවදා කෙරේදැයි කියන් නට බැරි බවත් අපි ම කියමු. කලට වෙලාවට වැඩක් කරන්නට නොහැකිවීම සැබැවින්ම අපේ කාලකණ්ණි කමකි. එනම් කාලය නිකම් කා දැමීමකි.

අනේ සිංහලයිනේ කලට වෙලාවට වැඩ කරන්න! සිංහල වෙලාවට පටන්ගන්නවාය කියන අමන සිතු විල්ල සිතින් බැහැරකරන්න!

ප්‍රමාදවීම සිංහලකම වන්නට ඉඩ දෙන්න එපා!

♦ **විල්ප්‍රඩ් පෙරේරා Berkshire UK**








## ඉරානයට වැඩම කළ භික්ෂූන් වහන්සේලා

**ප**සුගිය ඔක්තෝබර් 19 වෙනි දින බෞද්ධ භික්ෂූන් වහන්සේලා හත් නමකගෙන් සමන්විත දූත කණ්ඩායමක් ඉරාන රජයේ ආරාධනය මත ඉරානයට වැඩම කළේය. දෙරට අතර සංස්කෘතික සම්බන්ධතා තව තවත් දියුණුකර ගැන්මටත්, ශ්‍රීලංකාවේ වෙසෙන බෞද්ධ භික්ෂු සමාජයේ වර්තමාන කාර්‍යභාරය පැහැදිලි කිරීමත් එම දූත ගමනේ අරමුණ වීය. ඉරානයේ අධ්‍යාත්මික අංශයේ නායක ගරු සෙයිඩ් මොහොමඩ් කොමෙයිනි තුමා විසින් භික්ෂූන් වහන්සේලා ගෞරවයෙන් පිළිගන්නා ලදී.

කිරින්දේ අස්සජී හිමි, කොල්ලුපිටියේ ආචාර්‍ය මහින්ද සංඝරක්ඛිත හිමි, ලන්ඩන් විහාරාධිපති බෝගොඩ සීලවිමල හිමි, ආචාර්‍ය මාකඩවර ආනන්ද හිමි, කොග්ගල්ලේ විජිත හිමි, අතුරලියේ රතන හිමි සහ පොල්පිටිමූකලානේ පඤ්ඤාසාර හිමි මෙම දූත පිරිසට අයත් භික්ෂූන් වහන්සේලා ය. පින්තූරයේ මැද සිටින්නේ සෙයිඩ් මොහොමඩ් කොමෙයිනි තුමාය. ඉරානයේ ශ්‍රීලංකා තානාපති සුහායිර් මහතාද සහභාගි වීය.


